# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2134/41 - 2019 ජුලි මස 31 වැනි බදාදා - 2019.07.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III වැනි කොටස - ඉඩම්

### ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වෙනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: KWDS/LND/01/ACQ/111/2017.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය : 4-3/15/2017/VE/411.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය වන පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ /පරවශතාවේ විස්තර :-

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුකුළු කෝරළය මැද පත්තුවේ වැද්දාගල බටහිර ග්‍රාම නිලධාරි වසමේ වැද්දාගල ගමේ අ.ග.පි. 946හි අතිරේක අංක 8 හා පත්‍ර අංක 8හි කැබලි අංක 1401 වශයෙන් ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.5015ක් පමණ වූ පුහුල්පැල්පොල කිරිපුස්සයාහේන නමැති ඉඩම :

01. **අ.ග.පි. 946 හි කැබලි අංක 1401**

ඉඩමේ නම : පුහුල්පැල්පොල, කිරිපුස්සයාහේන; හිමිකම් කියන අය : ඩී. කේ. ඩී. තෙවරප්පෙරුම මිය, ආසිරි මාවත, බත්තරමුල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 2.5015.

පොදුජන කටයුත්ත - ගම් පුළුල් කිරීම යටතේ අවතැන්වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා නැවත අත්පත් කර ගැනීම.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 ඔක්තෝබර් මස 25 වැනි දින පෙ.ව. 10.00ට කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019.10.15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී *ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සංජීවනී කන්ඩම්බි,
ප්‍රාදේශීය ලේකම්,
කලවාන.

2019 ජුලි මස 24 වැනි දින,
කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 584

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : දෙහි/2-1/අත්/749.

නුගේගොඩ සාන්ත ජෝසප් බාලිකා විද්‍යාලයට ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ නුගේගොඩ ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙළ කරන ලද මු. පි. කො. 9821 දරන පිඹුරේ පෙන්නුම් කරන ලද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0654 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කැබලි.

01. **මු.පි.කො. 9821 හි කැබලි අංක 01**
ඉඩමේ නම : අළුබෝගහවත්ත, වරිපනම් අංක 147, හයිලෙවල් පාර; ඉඩම් පරිහරණය : ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි දෙකක් ඇත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන අය : සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0654

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2019 ඔක්තෝබර් 16 වන දින පෙ. ව. 10.00ට දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2019 ඔක්තෝබර් මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. ඔප්පු හා අනෙකුත් ලේඛන පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

නලිනි බාලසුබ්‍රමනියම්,
ප්‍රාදේශීය ලේකම්,
දෙහිවල.

2019 ජූලි මස 29 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
අංක 154, ගාලු පාර, දෙහිවල.

08 - 585

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.